**ජාතික ශිල්ප සභාව - 2023**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ජාතික ශිල්ප සභාවේ ("සභාව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 44 හා 47 ඡේදය ප්‍රකාරව තොග සම්බන්ධ සියලුම අලාභයන් කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවත් වරාගොඩ පුහුණු මධ්‍යස්ථානයේ පිරිවැය රු.1,320,396 ක් වූ තඹ රැහැන් කිලෝග්‍රෑම් 2099.5 ක තොගයක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර හා හෙළිදරව්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලෙවි නියෝජිතයින්ට නිකුත් කරන ලද තොගයෙන් සමාලෝචිත වර්ෂය තුළ විකුණා ඇති රු.154,228 ක තොග සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | නිකුත් කරන ලද තොග වලින් අලෙවි කරනු ලබන තොග ආදායම් ලෙස ගැනීමට කටයුතු කරනු ලැබේ. | විකුණුම් ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික ශිල්ප සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන වල පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුම් 75 ක එකතු ශේෂය වූ රු.4,217,663 ක් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | පුහුණු මධ්‍යස්ථාන වලට අදාල බැංකු ගිණුම් ශේෂයන් 2024 වර්ෂයේ සිට අවසන් ගිණුම් මගින් අනාවරණය කිරීමට කටයුතු කරනු ඇත. | සියලු බැංකු ගිණුම් විස්තර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ 2024 වර්ෂයේ දී ගෙවන ලද රු.1,374,177 ක වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර නොතිබුණි. | 2023/12/31 දිනට පසුව ගිණුම් අංශයට ලද සියළුම ගෙවීම්, පෙර වර්ෂයේ ගැලපීම් ලෙස ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත අලෙවි කරන ලද භාණ්ඩ වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.2,432,122 ක ශේෂයක් හා සභාව විසින් එම මණ්ඩලයට ගෙවිය යුතු රු.84,600 ක ශේෂයක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි. | ලක්සල ආයතනයෙන් ලැබිය යුතු ශේෂය සම්බන්ධයෙන් යම් එකගතාවයකට එළඹීම සඳහා ආයතන දෙකේ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු කරනු ඇත. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නොපමාව නිරවුල් කළ යුතුවේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14 (අ) | සියලුම අනාගත ලංසුකරුවන් හට එකම තොරතුරු සපයනු ලැබිය යුතු අතර අතිරේක තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන්ට සමාන අවස්ථා සලසා දීම සහතික විය යුතු වුවත් ඊට පටහැනිව දෙවන ලංසුකරුට පමණක් එය දැනුම් දී ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව අඩුකර කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | සියලුම ලංසුකරුවන් හට සමාන අවස්ථා ලබා දී ඇති අතර කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනය කර නොමැත. ලංසුකරු තෝරා ගැනීමෙන් පසු ආරක්ෂක නිලධාරීන් අඩු කර කොන්ත්‍රාත්තුව | සියලුම අනාගත ලංසුකරුවන් හට එකම තොරතුරු සපයනු ලැබිය යුතුවේ. |

| | | |
|---|---|---|
| | පිරිනැමීමට කටයුතු කර ඇත. | |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,019,195 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 7,877,209 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,141,986 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම රු.36,298,138 වැඩි වීමට සාපේක්ෂව මුළු වියදම රු.39,440,124කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ඔක්තෝබර් 31 වන විට සියලුම පළාත් හා දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ශිල්ප සමාජ 178 ක් පිහිටුවා තිබුණද ශිල්ප සමාජ ලියාපදිංචිය හා අධීක්ෂණය ජාතික ශිල්ප සභාව මඟින් සිදු කළ යුතු වුවත් ලියාපදිංචිය හැර වෙනත් කිසිදු අධීක්ෂණයක් හා මඟ පෙන්වීමක් සිදු කර නොතිබුණි. | ශිල්ප සමාජ වල සියළු සාමාජිකාවන් දැනුම්වත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරනු ඇත. | ශිල්ප සමාජ ක්‍රියාකාරීව පවත්වා ගෙන යා යුතුවේ |
| (ආ) | සභාව විසින් පෝසිලේන් රීල් ඉන්සියුලේටර් 379,645 ක් සහ පෝසිලේන් බුල්නෝස් ඉන්සියුලේටර් 39,135 ක් නිෂ්පාදනය කොට සැපයීමේ කොන්ත්‍රාත්තුව 2021 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත පවරා අයකිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු සඳහා දී තිබුණද 2022 දෙසැම්බර් මස දක්වා සපයා තිබූ පෝසිලේන් රීල් ඉන්සියුලේටර් ප්‍රමාණය 112,071 ක් හා පෝසිලේන් බුල්නෝස් ස්ට්‍රෙයින් ඉන්සියුලේටර් ප්‍රමාණය 11,996 ක් විය. එය ගිවිසුම්ගත ප්‍රමාණයෙන් සියයට 30 ක් පමණි. 2023 මාර්තු මස නිෂ්පාදන කටයුතු නතර කර තිබුණ ද ගොඩනැගිල්ල සහ යන්ත්‍ර සූත්‍ර මධ්‍යස්ථානය වෙත භාර දී නොතිබුණි. | අදාල ආයතනය විසින් අමුද්‍රව්‍ය හා අර්ධ නිමිතොග සැලසුම් කර ඇති පූර්ණ නිමි භාණ්ඩ බවට පත්කිරීමට සාමාන්‍ය සේවා ගාස්තු යටතේ අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටි බැවින් ඊට අවස්ථාව ලබා දී ඇත. | නිවැරදි ලේඛන මත පදනම්ව බඳවා ගැනීම් සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු වියදම්හි ඇතුලත් රු.2,065,904 ක රඳවාගැනීම් ශේෂය අදාළ කාර්යයන් නිම වී වර්ෂ 2 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආයතන දැනුවත් කර මෙම රඳවා ගැනීම් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂ දෙකකට වැඩි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය මූලික වශයෙන් සෙරමික් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම මගින් ශිල්පීන්ට සේවා සැපයීම උදෙසා පිහිටුවා තිබුණද අංශ 05 කට අයත් විදුලි පෝරණු, දර පෝරණු, ගෑස් පෝරණු, බෝල්මිල් යන්ත්‍ර, කිරුම් තරාදි, බ්ලෙන්ජර්යක් වශයෙන් රු.19,415,490 ක් වටිනා යන්ත්‍රෝපකරණ 2019 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි. තවද රු.2,800,000 ක් වටිනාකමැති බෝල්මිල් යන්ත්‍ර 02 ක් සහ විදුලි පෝරණු 03 ක් වසර ගණනාවක සිට අක්‍රීයව පැවතුණි. | සෙරමික් පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට පෙර මූලික රතුමැටි පුහුණු පාඨමාලාව 2022 වර්ෂයේ අගභාගයේදී ආරම්භ කරන ලද අතර එම පාඨමාලාව සම්පූර්ණ කරන ලද පුහුණුලාභීන් සඳහා 2024 මැයි මාසයේ සිට සෙරමික් ආශ්‍රිත කලා හා නිර්මාණවේදී උසස් සහතිකපත්‍ර පාඨමාලාව සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ අචාර්යවරුන්ගේ දායකත්වයෙන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. එම පාඨමාලාව පවත්වාගෙන යාමේදී සියළුම උපකරණ පූර්ණව උපයෝජනය වනු ඇත. | පුහුණු මධ්‍යස්ථානයේ වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වරාගොඩ, මොලගොඩ, පොල්ගොල්ල හා බුලත්සිංහල පුහුණු මධ්‍යස්ථාන වල පිහිටුවීමට යෝජිතව තිබූ අමුද්‍රව්‍ය බැංකු වෙනුවෙන් 2021 වර්ෂයේ මිලදී ගත් රු.1,136,076 ක් වටිනා උපකරණ හා 2022 වර්ෂයේ ඇසුරුම්කරණ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.64,600 ක් වටිනා මැටි කැට 76 ක් ඌණ උපයෝජිතව පැවතුණි. | අමුද්‍රව්‍ය බැංකු ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත්, අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගන්නා බවත් දන්වා ඇත. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවේ. |
| (ඇ) | 2013 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු පදනම මත කාවන්තිස්සපුර ගම්මානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 1.6187 ක භූමියක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන බදු කුලී වශයෙන් රු. 3,360,000 ක් හා ඉන්දීය රජයේ මූල්‍ය ආධාර රු.18,432,042 ක් හා සභාව විසින් රු.8,744,211 ක් වැය කර ඉදිකිරීම් කර තිබුණද විගණිත දිනය වන විටත් භූමිය හා ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි. | මෙම ව්‍යාපෘතිය ඉන්දීය රජයේ ප්‍රතිපාදන මත ඉදිකරන ලද්දක් බැවින් තවත් මාස 06 ක් වෙනත් විකල්ප ආයෝජනයන් සඳහා අවස්ථාව ලබා දී එය ද අසාර්ථක වුවහොත් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා දීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දී උපදෙස් ලබා දෙන ලදී | කාවන්තිස්සපුර ගම්මානය ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වේවැල් යන්ත්‍ර තුනක් නිෂ්පාදනය කරගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට 2022 වර්ෂයේදී රු.3,850,740 ක් ගෙවා තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ යන්ත්‍ර සභාව වෙත ලැබී නොතිබුණි. | කාර්මික සංවර්ධන මණ්ඩලයේ කටුබැද්ද ප්‍රධාන කාර්යාලය මගින් සියයට 90 ක ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇති අතර එම යන්ත්‍ර 03 2024 ජුනි 25 දිනට පෙර අප ආයතනයට ලබා දෙන බව ලිඛිතව දන්වා ඇත. | යන්ත්‍ර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. |